# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,879/9 — 1969 නොවැම්බර් 19 වැනි බදාදා — 1969.11.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී.—බී. 33/54.

### උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත

5 වැනි වගන්තිය යටතේ නිවේදනය

(110 වැනි අධිකාරය වන) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 5 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති, විජයානන්ද දහනායක වන මම, 1935 සැප්තැම්බර් මස 20 වැනි දින අංක 8,146 දරණ ගැසට් පත්‍රයේ අතිරේකයෙහි පළ කරනු ලැබූ නිවේදනය, එයට යා කොට ඇති උපලේඛනයේ " නැගෙනහිර පළාත, අම්පාර දිස්ත්‍රික්කය " යන ශීර්ෂය යටතේ—

(1) පොතුවිල් කොට්ඨාශයට අදාල වන අංක 16 දරණ විෂය වෙනුවට මෙහි "අ" උපලේඛනයේ සඳහන් විෂය ආදේශ කිරීමෙන් හා,

(2) අංක 16 දරණ විෂයට ඉක්බිතිවම මෙහි "ආ" උපලේඛනයේ සඳහන් 16 අ දරණ විෂය ඇතුළත් කිරීමෙන්

1970 ජනවාරි 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් සංශෝධනය කරමි.

වි. දහනායක,
ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ දීය.

### අ උපලේඛනය

16. පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත උතුරු පොතුවිල් කොට්ඨාශය :—

අරුගම්බෙ
ඉන්ස්පෙක්ටර් ඒත්තම්
කලපුකට්ටු
කරප්පුකේනි
කෝමාරි
කෝසන්චේනයි
කුන්ඩුමඩු
මසූරන්චේනයි
නාවල්ආරු
පාක්කියවත්තෙයි
පසරිචේනයි
පොතුවිල් 1 වැනි කොට්ඨාශය
පොතුවිල් 2 වැනි කොට්ඨාශය
පොතුවිල් 3 වැනි කොට්ඨාශය
පුදුකුඩිඉරුප්පු
රොට්ට
සන්ගමාන්කන්ඩි
සෙන්ගාමම්
සිරියා පෝට්ටා
තාමරක්කුලම්
තිමිට්ටා වත්ත
උල්ලෙයි
ඌරනි
වට්ටිවෙලි

### ආ උපලේඛනය

16 අ. පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත දකුණු පොතුවිල් කොට්ඨාශය :—

කුමන
ඕකන්ද
පානම
රාගන්වෙලි
රදල්ල

11–488